# සංගායනා සංක්ෂිප්ත සටහන.

| | ප්‍රථම සංගායනාව (පංච සතිකා) | ද්විතීය සංගායනාව (සප්ත සතිකා) | තෘතීය සංගායනාව | සිව්වන ථේරවාදී සංගායනාව |
|---|---|---|---|---|
| බුද්ධ පරිණිර්වාණයෙන් ගත වූ කාලය | මාස 03 | වසර 100 | වසර 236 | වසර 518 |
| ස්ථානය | රජගහනුවර වේභාර පර්වත පාමුල සප්තපර්ණී ගුහා ද්වාරය | විශාලා මහනුවර වාලුකාරාමයේදී | පැළලුප් නුවර අශෝකාරාමයේදී | ශ්‍රී ලංකාවේ මාතලේ අළුවිහාර ආලෝක ලෙනෙහි දී |
| මූලිකත්වය | මහා කාශ්‍යප මහරහතන් වහන්සේ | සබ්බකාමී හා යස මහරහතන් වහන්සේලා | මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ | මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා |
| දායකත්වය | අජාසත්ත රජු | කාලාශෝක රජු | ධර්මාශෝක අධිරාජයා | වළගම්බා රාජ්‍ය සමයේ මාතලේ ප්‍රාදේශීය නායකයෙකු විසින් |
| සහභාගී වූ පිරිස | පන්සියයක් මහ රහතන් වහන්සේලා | හත්සියයක් රහතන් වහන්සේලා | රහතන් වහන්සේලා 1000 | මහාවිහාරීය බහුශ්‍රැත භික්ෂූන් |
| හඳුන්වන නාමය | පංච සතිකා සංගීති | සප්ත සතිකා සංගීති | සාහස්සිකා | |
| පැවැත්වූ කාලය | මාස 07 | මාස 08 | මාස 09 | |
| පැවැත්වීමට හේතු වූ කරුණු | <u>ආසන්න හේතුව</u><br>සුභද්‍ර නම් දුර්මතධාරී භික්ෂුවගේ වැරදි ප්‍රකාශය<br><br><u>දුරස්ථ හේතුව</u><br>ධර්මයෙහි විනයෙහි සුරක්ෂිතභාවය ඇති කිරීම | වජ්ජිපුත්‍රක භික්ෂූන් විසින්ගෙනෙන ලද දස අකැප වස්තුව<br><br>ධර්මය හා විනය විධිමත්ව සැකසීමේ අවශ්‍යතාව | ලාභ අපේක්ෂාවෙන් පැවිදි වූ පිරිස් බහුල වීම<br><br>ධර්මය හා විනය ක්‍රමවත්ව සැකසීමේ අවශ්‍යතාවය | ධර්මය කට පාඩමින් පවත්වා ගෙන යාමේ අවදානම වළකාගැනීමට<br><br>"බැමිණිතියා" නම් සාගතය හමුවේ ධර්මධර භික්ෂූන් මුහුණ දුන් ගැටලු |
| ප්‍රතිඵල | සුභද්‍රභික්ෂුව ප්‍රධාන වැරදි පිළිවෙත් අනුගමනය කළ භික්ෂූන්ට දඬුවම් පැමිණවීම<br><br>ධර්මය හා විනය සංගායනාකොට ඒවා පවත්වාගෙන යාමට වැඩ පිළිවෙලක් සැකසීම | දස අකැප වස්තුව විනය විරෝධි බවට ප්‍රතික්ෂේප කිරීම<br><br>වජ්ජිපුත්‍රක භික්ෂූන් සසුනෙන් නෙරපීම ථේරවාද හා මහා සාංඝික නිකාය 2 ක් ඇති වීම | ලාභ අපේක්ෂාවෙන් පැවිදි වී සිටි අධර්මවාදී අවිනයවාදී 60000 ක් සසුනෙන් නෙරපීම<br><br>කථාවත්ථුප්පකරණය අභිධර්ම ග්‍රන්ථය සම්පාදනය | ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම |